**බෙන්තොට ප්‍රාදේශීය සභාව**

**2027 වර්ෂයට සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

2027 වර්ෂයට බෙන්තොට සභාවට අවශ්‍ය පහත සඳහන් සැපයුම් හා සේවාවන් ලබා ගැනීම සඳහා සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත් කැඳවනු ලැබේ.

1. සියලුම අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ ඉහළ වම්පස කෙළවරේ **"සැපයුම්කරුවන් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2027"** යනුවෙන් සඳහන් කළ යුතු අතර, ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් **2026/12/10 දින ප.ව.03.00** හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ඒ සඳහා ගෙවන ලද ලියාපදිංචි ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

2. වැඩි විස්තර දුරකතන අංක 034 – 2275419 අමතා ලබාගත හැක.

| අනු අංකය | සැපයුම් අයිතම | ලියාපදිංචි ගාස්තු |
|---|---|---|
| 1 | නාම පුවරු/ දැන්වීම් පුවරු/ බැනර් සකසා සැපයීම | 750.00 |
| 2 | පළිබෝධනාශක හා වල්නාශක සැපයීම | 750.00 |
| 3 | වාහන බලපත්‍ර තහඩු වර්ග සැපයීම | 750.00 |
| 4 | රබර් මුද්‍රා/ දින මුද්‍රා සැපයීම | 750.00 |
| 5 | සමරු තිළිණ හා පදක්කම් ආදිය සැපයීම | 500.00 |
| 6 | කාර්යාලීය ලිපි ද්‍රව්‍ය /සහතික පත්‍ර/ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම | 1000.00 |
| 7 | සියලුම කාර්යාලීය ලිපිද්‍රව්‍ය, පාසල් උපකරණ,පොත් බෑග්,වතුර බෝතල් ඇතුළුව සැපයීම | 1500.00 |
| 8 | කාර්යාලීය මුද්‍රණ කටයුතු සඳහා ටෝනර්, ඉන්ක්, කාට්රිජ්, රිබන් සැපයීම | 3000.00 |
| 9 | පුස්තකාල පොත් සැපයීම/ පුවත්පත් සැපයීම | 3000.00 |
| 10 | කාර්යාලීය පරිගණක/ පරිගණක මෘදුකාංග (Software) හා පරිගණක ආරක්ෂක මෘදුකාංග (Virus Guard) සැපයීම/රෝනියෝ යන්ත්‍ර/ ඡායා පිටපත් යන්ත්‍ර/ ෆැක්ස් යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර/ ඇඟිලි සලකුණු කිරීමේ යන්ත්‍ර ඇතුළු තාක්ෂණික උපාංග සැපයීම | 3000.00 |
| 11 | ශබ්ද විකාශන උපකරණ, ආරක්ෂිත කැමරා පද්ධති සැපයීම හා සවි කිරීම | 2500.00 |
| 12 | වායු සමීකරණ යන්ත්‍ර, විදුලි ජනක යන්ත්‍ර සැපයීම සවි කිරීම සහ අලුත්වැඩියා කිරීම | 2000.00 |
| 13 | කාර්යාලීය ලී බඩු හා වානේ කබඩ් ඇතුළුව අනෙකුත් උපකරණ සැපයීම | 3000.00 |

| | | |
|---|---|---|
| 14 | පෙර පාසල් මේස, පුටු, සෙල්ලම් මිදුල උපකරණ සැපයීම | 3000.00 |
| 15 | සනීපාරක්ෂක උපකරණ සැපයීම (සනීපාරක්ෂක සබන් හා දියර වර්ග, අත්වැසුම්, කසළ බඳුන්, කොසු, ඉදල්) | 3000.00 |
| 16 | සියලුම වර්ගයේ හාඩ්වෙයාර් බඩු සැපයීම (සියලුම වර්ගයේ ඉදිකිරීම් ද්‍රව්‍ය සිමෙන්ති, ගල්, වැලි, ගඩොල්,පස්,තාර,තණකොළ පිඩලි, බොරළු, වීල් බැරැක්ක, විසි කැති, රේක්ක, උදළු,ජල නළ උපාංග, යකඩ,ඇලුමිනියම්, තීන්ත වර්ග ඇතුළුව සියලු ද්‍රව්‍ය) | 2000.00 |
| 17 | කොන්ක්‍රීට් භාණ්ඩ හා හියුම් පයිප්ප සැපයීම | 1000.00 |
| 18 | විදුලි උපකරණ සැපයීම (වීථි පහන් සහ උපාංග) | 3000.00 |
| 19 | ආරක්ෂක සපත්තු හා අත්වැසුම්, ආරක්ෂිත ඇඳුම්, ආරක්ෂක බඳපටි සැපයීම | 2000.00 |
| 20 | ෆයිබර් ඉණිමං/ ඇලුමිනියම් ඉණිමං ඇතුළු ඇලුමිනියම් උපකරණ සැපයීම | 3000.00 |
| 21 | සියළුම වර්ගයේ වාහන අමතර කොටස් සැපයීම | 3000.00 |
| 22 | වාහන ටයර්/ ටියුබ් සහ වාහන බැටරි සැපයීම | 3000.00 |
| 23 | ගෑස් සැපයීම | 3000.00 |
| | <u>සේවාවන්</u> | |
| 24 | අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම | 500.00 |
| 25 | ශබ්ද විකාශන යන්ත්‍ර සැපයීම/ විදුලි ජනක යන්ත්‍ර කුලී පදනමින් සැපයීම | 1000.00 |
| 26 | නිල ඇඳුම් මැසීම (නිල ඇඳුම්, තිර රෙදි, පෙර පාසල් නිල ඇඳුම්) | 1500.00 |
| 27 | කුලී පදනම මත ප්‍රවාහන පහසුකම් සැපයීම | 1000.00 |
| 28 | උත්සව අවස්ථාවල දී ආහාරපාන සැපයීම | 1000.00 |
| 29 | නීති කටයුතු සඳහා නීති උපදේශන සේවා සැපයීම | 1000.00 |
| 30 | ඉඩම් මැනුම් කටයුතු සිදු කිරීම | 2000.00 |
| 31 | කුලී පදනම මත උත්සව භාණ්ඩ සැපයීම | 1000.00 |
| 32 | සභාව සතු පැරණි පුවත්පත්, වීදුරු බෝතල්, පරණ යකඩ මිලදී ගැනීම | 500.00 |
| 33 | අන්තර්ජාල සේවා, වෙබ් පිටු සැකසීම හා පරිගණක ජාල සේවා සැපයීම | 1500.00 |
| 34 | ඡායාරූපකරණය වීඩියෝගත කිරීම | 1500.00 |
| 35 | ආදාහනාගාර නඩත්තු සේවා සැපයීම | 3000.00 |

| | | |
|---|---|---|
| 36 | තාක්ෂණික උපකරණ අලුත්වැඩියාව සිදු කිරීම (පරිගණක,ප්‍රින්ටර්, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වායු සමීකරණ, ආරක්ෂිත කැමරා පද්ධති ආදිය) | 1000.00 |
| 37 | වාහන කුෂන් අලුත්වැඩියාව | 1000.00 |
| 38 | වාහන සේවා කිරීම හා ඔයිල් වර්ග සැපයීම | 3000.00 |
| 39 | වාහන අලුත්වැඩියා කිරීම (විදුලි පද්ධතිය/ වායු සමීකරණ පද්ධතිය අලුත්වැඩියාව ද ඇතුළුව)<br>40.1 බැකෝ යන්ත්‍ර<br>40.2 ට්‍රැක්ටර් රථ<br>40.3 ත්‍රීවිල්<br>40.4 කැබ් රථ, කෘ කැබ්, ජල බවුසර, වෙනත් | 3000.00 |
| 40 | කුළී පදනම මත ට්‍රැක්ටර්, ගල් රෝල්, ඩෝසර්, එක්ස්කැවේටර්, බැකෝ ආදී බර වාහන සහ යන්ත්‍ර සූත්‍ර සැපයීම | 3000.00 |
| 41 | **<u>ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්</u>** | |
| | ඉදිකිරීම් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් - (මාර්ග, ගොඩනැගිලි හා ජලාපවහන කාණු ඉදිකරීම සඳහා)<br><br>41.1 - රු. 10,000,000.00 දක්වා<br>41.2 - රු. 10,000,000.00 ට වැඩි | රු. 3000.00<br>රු.5000.00 |

<u>කොන්දේසි :-</u>

1. ලියාපදිංචි වීමට අපේක්ෂා කරනු ලබන සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන් විසින් ඔබගේ විස්තර සමඟ ලියාපදිංචි වීමට අපේක්ෂා කරනු ලබන එක් එක් අයිතමය වෙනුවෙන්, හඳුන්වාදී ඇති නියමිත ආකෘති පත්‍රය www.bentotaps.lk අපගේ වෙබ් අඩවියේ Downloads වෙත පිවිස එම ආකෘතිය භාගත කර ඒ අනුව ලියාපදිංචි වන අයිතමය හා අයිතමයේ අංකය නිවැරදිව සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

2. අයදුම්පත් අයිතමයට අදාළ ලියාපදිංචි ගාස්තු ද සමඟ "සභාපති, ප්‍රාදේශීය සභාව, බෙන්තොට" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කළහැක.ලියාපදිංචි ගාස්තු චෙක්පත් මගින් එවන්නේ නම් **"බෙන්තොට ප්‍රාදේශීය සභාව"** යනුවෙන් චෙක්පත ලිවිය යුතුය.

3. ලියාපදිංචි වන සැපයුම්/ සේවා ආයතන ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ හා වැට් බදු සඳහා ලියාපදිංචි වී ඇත්නම් එම සහතික පිටපත් ද සමඟ අයදුම්පත් සමඟ ඉදිරිපත් කළ යුතුය.

4. ඉල්ලුම් කළ විට මිල ගණන් ඉදිරිපත් නොකරන හා ඇණවුම් කළ විට නියමිත පරිදි භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන් ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

5. ලියාපදිංචි සැපයුම්කරුවන් වෙතින් අවශ්‍ය පරිදි මිල ගණන් කැඳවනු ලබන අතර, ප්‍රමාණවත් සැපයුම්කරුවන් නොමැති අවස්ථාවලදී අවශ්‍යතාවය මත බාහිර සැපයුම්කරුවන්ගෙන් ද මිල ගණන් කැඳවා මිලදී ගැනීම හා සේවා ලබා ගැනීම සම්බන්ධ අයිතිය බෙන්තොට ප්‍රාදේශීය සභාව සතු වේ.

6. ඇණවුම් කරන භාණ්ඩ ගෙනවිත් භාරදීම සඳහා එකඟත්වය පළ කරන සැපයුම්කරුවන් සඳහා ප්‍රමුඛත්වය දක්වනු ලැබේ.

7. මිලදී ගැනීම් සඳහා ගෙවීම් කරනු ලබන්නේ භාණ්ඩ හා සේවාවන් සැපයීමෙන් පසුවය. ඒ සඳහා අවම වශයෙන් දින 30ක කාලයක් බෙන්තොට ප්‍රාදේශීය සභාව වෙත ලබා දිය යුතුය.

ප්‍රේමකුමාර විජේවර්ධන,
සභාපති,
බෙන්තොට ප්‍රාදේශීය සභාව.
2026/10/15.